# RTI

## ඔබගේ අයිතිය සහ නීතිය පැහැදිලිකිරීමක්



# තොරතුරු දැනගැනීමට ඔබට ඇති අයිතිය කුමක්ද?

තොරතුරු දැනගැනීම සඳහා සෑම පුරවැසියකුටම අයිතිවාසිකමක් ඇති බවත් ඕනෑම පොදු අධිකාරියක වාර්තා ලෙස පවත්වාගෙන යන තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව තොරතුරු සඳහා ඇති අයිතිය යන්නෙන් අදහස් කෙරෙන බව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3වන වගන්තියේ සඳහන් කර තිබේ.




ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි රටේ පරමාධිපත්‍ය ජනතාව සතුවේ. ජනතාවට තමන් තෝරා පත් කරගත් නියෝජිතයින් හරහා මෙම පරමාධිපත්‍ය බලය නියමාකාරයෙන් ක්‍රියාත්මක කළහැකි වන්නේ පාලන ක්‍රමය විවෘත හා විනිවිදභාවයෙන් යුක්ත වුවහොත් පමණි.



ඒ අනුව, පොදු ක්‍රියාකාරකම් ඉටු කරන පෞද්ගලික ආයතන ද ඇතුළුව ඕනෑම රජයේ කාර්යාලයකින් තොරතුරු ලබා-ගැනීමට ඔබට හැකියාව තිබේ. රජයේ නිලධාරීන් සිදු කරන්නේ මහජන මුදල් මහජනයා වෙනුවෙන් පරිහරණය කිරීමයි.



එමනිසා, ඒ සම්බන්ධ තොරතුරු ලබා-ගැනීමට ඔබට අයිතියක් ඇත. 2016 අගෝස්තු මාසයේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්මත කරගනු ලැබුවේ එවැනි විවෘත පාලන පද්ධතියක් ඇති කිරීමේ අදහස සහිතවැයි.

ආගමික නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය යනාදී වෙනත් අයිතිවාසි-කම් ආරක්ෂා කිරීම සඳහා ද තොරතුරු දැනගැනීමට ඔබට ඇති අයිතිය වැදගත් වේ.

# තොරතුරු දැනගැනීමේ ක්‍රියාවලිය තුළ ප්‍රධාන ක්‍රියාකරුවන් කවුද? ඔබට උදවු කළ හැක්කේ කාටද?

- පොදු අධිකාරීන්
- තොරතුරු නිලධාරීන්
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව



## පොදු අධිකාරීන් යනු කවුරුන්ද? කුමන ආයතනද?

1. රජයේ ඕනෑම අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් ඕනෑම නීතියක් යටතේ නිර්මාණය කළ ඕනෑම ආයතනයක්
3. රජයේ සංස්ථා
4. පළාත්පාලන ආයතන
5. රජය හෝ පළාත්පාලන ආයතනයක් සමගින් ව්‍යවස්ථාපිත / රජයේ කාර්යයන් සිදුකරන පෞද්ගලික ආයතන හෝ සංවිධාන - මෙහිදී ඔබේ අයිතිවාසිකම බලපවත්වන්නේ අදාළ ව්‍යවස්ථාපිත / රජයේ කාර්යයට අදාළව පමණි
6. පළාත්සභාවක් විසින් ඇතිකරන ඕනෑම ආයතනයක්
7. රාජ්‍ය නොවන සංවිධාන - මෙම සංවිධානවලට ශ්‍රී ලංකා රජය, විදේශ රජයක්, හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් සැලකියයුතු මට්ටමකින් අරමුදල් ලබා දෙන්නේ නම්, එම සංවිධාන මහජනතාවට සේවා සපයා දෙන අවස්ථාවලදී පමණක් අදාළ වේ

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව සම්බන්ධ කරගතහැකි ආකාරය, කොමසාරිස්වරුන්ගේ නම්, තොරතුරු නිලධාරියා සම්බන්ධ කරගතහැකි ආකාරය□ අභියාචනා නිලධාරියා සම්බන්ධ කරගතහැකි ආකාරය, තොරතුරු ලබාගැනීමේදී ගෙවියයුතු යම් ගාස්තුවක් වෙතොත් ඒ පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියේ දැකගතහැකි අන්දමින් ප්‍රදර්ශනය කිරීමට රාජ්‍ය ආයතන කටයුතු කළයුතු වේ. (26 වගන්තිය)

8. ඕනෑම නීතියක් යටතේ බලපත්‍රලාභී හෝ රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත්සභාවක් විසින් සාදන ලද ආයතනයක් විසින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අරමුදල් ලබාදෙන්නා වූ උසස් අධ්‍යාපන ආයතන

9. ඕනෑම නීතියක් යටතේ ස්ථාපිත කළ හෝ රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත්සභාවක් විසින් සාදන ලද ආයතනයක් විසින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අරමුදල් ලබාදෙන්නා වූ පෞද්ගලික අධ්‍යාපන ආයතනයක්

10. අධිකරණ සහ යුක්තිය පසිඳලීම සඳහා ස්ථාපිත කර ඇති අනෙකුත් ආයතන

## තොරතුරු නිලධාරියකු යනු කවුරුන්ද? (23 වගන්තිය)



- තොරතුරු නිලධාරීන් පත් කරනු ලබන්නේ පොදු අධිකාරීන් විසිනි
- ඔබ විසින් තොරතුරු ඉල්ලා සිටිය යුත්තේ මෙම නිලධාරීන්ගෙන් වේ
- සෑම පාසලකම, පොලිස් ස්ථානයකම, රජයේ දෙපාර්තමේන්තුවකම යනාදී සෑම ආයතනයකම ඔබට සම්බන්ධ විය හැකි තොරතුරු නිලධාරියකු සිටිනු ඇත

## තොරතුරු නිලධාරියාගේ වගකීම් මොනවාද? (25 වගන්තිය)

- තොරතුරු ලබාදෙන මෙන් කළ සෑම ඉල්ලීමක්ම ලැබුණු බව ලිඛිතව පිළිගැනීම

- ඉදිරිපත් වූ ඉල්ලීම් සහ ලබාදුන් ප්‍රතිචාර සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යාම
- පහත කරුණු පිළිබඳව හැකිතාක් ඉක්මනින් හෝ දින 14ක් තුළ තීරණය කිරීම:
    - ඉල්ලා සිටි තොරතුරු ලබාදෙන්නේද
    - ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේද
    - ගනු ලැබූ තීරණය ඉල්ලීම සිදුකළ පුද්ගලයාට දැනුම්දීම




## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව යනු කුමක්ද? (12 වගන්තිය)

රාජ්‍ය නිලධාරීන් තොරතුරු සපයා නොදෙන්නේ නම් හෝ ඔවුන්ගේ රාජකාරිය ඉටු නොකරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඕනෑම අභියාචනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව කටයුතු කරන්නේය.

# තොරතුරු ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර මොනවාද?

- ඔබව සම්බන්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර හැරෙන්නට, තොරතුරු ඉල්ලා සිටින්නේ ඇයිද යන්න පිළිබඳ කිසිදු හේතුවක් හෝ වෙනත් පෞද්ගලික තොරතුරු කිසිවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ
- ඉල්ලා සිටින තොරතුර ඔබට පෞද්ගලිකවම වන කරුණක් වීම අවශ්‍ය නොවේ




* (අ) ඔබ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 3 වැනි වගන්තිය ප්‍රකාරව තොරතුරු ඉල්ලා සිටින බව

(ආ) ඔබ ඔබගේ ඉල්ලීමට අදාළ ප්‍රතිචාරය ලබා ගැනීමට කැමති කවර භාෂාවකින්ද යන්න


(ඇ) ඔබව සම්බන්ධකර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර

(ඈ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ය යන වග

# ඔබගේ ඉල්ලීම භාරගනු ලැබුවහොත් ඔබට හිමිවන අයිතිවාසිකම් මොනවාද?

- ඔබට ලැබෙන තොරතුරු ප්‍රසිද්ධ කිරීමට ඔබට අයිතිය තිබේ (36 වගන්තිය)
- ඔබට ලැබෙන තොරතුරු නඩුවක සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට ද ඔබට හැකිය

## කාල රාමුව




තොරතුරු ඉල්ලා සිටීම අදාළ පුද්ගලයාගේ ජීවිතයට සහ පුද්ගලික නිදහසට අදාළ වන්නේ නම්, පැය 48ක් ඇතුළත පිළිතුරු ලබාදීම සිදු කළ යුතුය. (25(3) වගන්තිය)

දින 14 - 28 ක කාලයක් ඇතුළත එම තොරතුරු වෙත ප්‍රවිශවීමේ අයිතිය. (25 වගන්තිය)

සීමිත හේතුන් මත එම කාලය දින 21ක් දක්වා වන කාලයකින් දීර්ඝ කිරීමට තොරතුරු නිලධාරියා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැක (උදාඃ තොරතුරු තිබෙන්නේ වෙනත් ස්ථානයක නම් හෝ ඉතා විශාල තොරතුරු ප්‍රමාණයක් ඉල්ලා ඇත්නම්).

## ඔබේ ඉල්ලීමට ලැබිය හැකි ප්‍රතිචාර



- තොරතුරු ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අවසර ලබා දී ඇත්නම්, අදාළ කටයුතු, ලිපිලේඛන□ ලිපි ලේඛනවල හෝ වාර්තාවල සහතික කරන ලද පිටපත් විමර්ශනය කිරීමට හෝ ඕනෑම විද්‍යුත් හෝ මුද්‍රිත ආදී ස්වරූපයකින් එම තොරතුරු ලබා ගැනීමටත් ඔබට හැකිය. (27 වගන්තිය)



- තොරතුරු ඉල්ලා සිටීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, තොරතුරු නිලධාරියාඃ
  - » එසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු;
  - » අභියාචනයක් ඉදිරිපත් කළ යුතු කාල සීමාව සහ අභියාචනය ඉදිරිපත් කළ යුත්තේ කවර නිලධාරියෙකුටද යන්න සඳහන් කළ යුතුය. (28 වගන්තිය)

# අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය කවරේද?

ඔබට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ස්ථාන තුනක් පහත සඳහන් අනුපිළිවෙලට තිබේ:

- අභියාචනා නිලධාරී (31 වගන්තිය)
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව (32 වගන්තිය)
- අභියාචනාධිකරණය (34 වගන්තිය)

1) පහත සඳහන් හේතුන් මත ඔබට අභියාචනා නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක:

(අ) තොරතුරු සඳහා කරන ලද ඉල්ලීමක් හෝ තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කිරීම

(ආ) නියමිත කාල සීමාවට අනුකූලව නොවීම

(ඇ) අසම්පූර්ණ, නොමග යවනසුළු හෝ සාවද්‍ය තොරතුරු සපයාදීම

(ඈ) අධික ගාස්තු අයකිරීම

(ඉ) තොරතුරු ඉල්ලා ඇති පරිදි සපයා නොදීම

(ඊ) තොරතුරු විකෘති කර, විනාශ කර හෝ සිතාමතාම අස්ථානගත කර තිබේ නම්:

> ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේපවී දින 14 ක් ඇතුළත ඔබගේ අභියාචනය අභියාචන නිලධාරියාට ඉදිරිපත් කිරීමට වග බලා ගන්න.

- අභියාචනය භාර ගැනීමේදී අභියාචනා නිලධාරීයා අභියාචනය භාරගත් බවට රිසිට්පතක් නිකුත් කළ යුතුය
- සති තුනක් ඇතුළත එම අභියාචනය පිළිබඳ තීරණයක් ලබා දිය යුතුය
- එම තීරණය සඳහා හේතු සහ එයට පදනම් වූ විශේෂිත කරුණු ද එම තීරණයට ඇතුළත් විය යුතුය

2) ඔබට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ කුමන අවස්ථාවලදීද?

- අභියාචනා නිලධාරියා විසින් ලබා දුන් තීරණය

> අභියාචනා නිලධාරියාට හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය ඉදිරිපත් කිරීමට ඔබට නොහැකි නම්, ඔබට ඔබ වෙනුවෙන් එම අභියාචනය ඉදිරිපත් කිරීමට වෙනත් පුද්ගලයෙකු වෙත ලිඛිතව බලය පවරා දිය හැක. (33 වගන්තිය)

පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, එම තීරණය ලැබී මාස දෙකක (2) කාලයක් ඇතුළත ඔබට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැක

- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව දින තිහක (30) කාලයක් ඇතුළත ඒ පිළිබඳ තීරණයක් ගත යුතුය
- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයඃ
  - » අදාළ තොරතුරු ඉල්ලා සිටි පුද්ගලයාට;
  - » තොරතුරු නිලධාරීයාට සහ අදාළ රාජ්‍ය ආයතනයට ලිඛිතව ලබා දිය යුතුයි

3) අභියාචනාධිකරණයඃ

- තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන පුද්ගලයෙකුට හෝ රාජ්‍ය බලධාරී ආයතනයකට අභියාචනාධිකරණයෙහි නඩුවක් ගොනු කළ හැක

# තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථාන

## 1996

### උපදේශක කමිටුවේ නිර්දේශය

පුවත්පත් නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් උපදේශක කමිටුවක් පිහිටුවනු ලබයි. එහි 3වන නිර්දේශය වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අනුව යමින් අදහස් ප්‍රකාශකිරීමේ නිදහස යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළත් කරන ලෙසයි.

## 2000

### අසාර්ථක වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ඇතුළත්වීම

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන්නට දැරූ වෑයම අනුව සකසන ලද ආණ්ඩුක්රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි මූලික අයිතිවාසිකම් යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළත් කර තිබිණි.

## 2004

### අමාත්‍ය මණ්ඩලයෙන් පනත් කෙටුම්පතක් අනුමත වෙයි

සංස්කාරකවරුන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුන්වාදුන් පනත් කෙටුම්පතක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබෙන අතර අධිකරණ අමාත්‍යාංශයෙන් එහි අවසන් පිටපත සකස් කරනු ලබයි. කෙසේනමුත් ඉන් අනතුරුව පාර්ලිමේන්තුව විසුරුවාහරිනු ලැබූ හෙයින් මෙම පනත් කෙටුම්පත පිළිබඳ රජයේ උනන්දුව හීනවී ගියේ ය.

## 2006

### ශ්‍රී ලංකා නීති කොමිසමේ යෝජනාව

දේශසීමා අභිබවා යන අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණයට එරෙහි සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති හෙයින් විශේෂයෙන්ම එය සලකා බලා තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පතක් හඳුන්වාදීම සිදුසු බව නීති කොමිෂන් සභාවෙන් නිර්දේශ කර තිබේ.

## 2010

### මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධවීම

එකල රජයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්, එනම් මිලින්ද මොරගොඩ, විජේදාස රාජපක්ෂ, කරු ජයසූරිය සහ තිලංග සුමතිපාල යන මන්ත්‍රීවරුන් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඇතුළුව මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ වෑයම් දැරුවද ඒවා අසාර්ථක විය.

## 2011

### උගත්පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් නිර්දේශ

ප්‍රතිසන්ධානය සඳහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඉතා වැදගත් භූමිකාවක් නිරූපණය කරන බවත් තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කෙරෙන සේ නීතිය ප්‍රතිසංස්කරණය වියයුතු බවත් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පවසයි.

## 2015

### මැතිවරණ ව්‍යාපාරයේ පොරොන්දුව

ජනාධිපතිවරණයේදී "පොදු අපේක්ෂකයා" වූ මෛත්‍රීපාල සිරිසේන මහතා තමන් බලයට පත්වී දින සියයක් ඇතුළත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතක් හඳුන්වාදීමට පොරොන්දු වෙයි.

## 2016

### තොරතුරු දැනගැනීමේ පනත පාර්ලිමේන්තුවේ සම්මත වෙයි

මාර්තු මාසයේදී පාර්ලිමේන්තුවට හඳුන්වාදුන් පනත් කෙටුම්පත, ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුවලින්, පළාත් සභා ඉදිරිපත් කළ යෝජනා අනුව සහ රජය හා විපක්ෂයෙන් සිදුකළ වෙනස්කම් අනුව සංශෝධනය වීමෙන් අනතුරු ව, අගෝස්තු මාසයේදී නීතියක් බවට පත්වෙයි.

මූලාශ්‍රය: https://www.rti.gov.lk/about-rti/history

# ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක්කේ කුමන ආකාරයේ තොරතුරුද?

කිසියම් තොරතුරක් ලබාදීම මගින් සිදුවිය හැකි මහජන සුභසිද්ධිය එම තොරතුර හෙළිකිරීමෙන් සිදුවිය හැකි හානියට වඩා වැඩි නම්, එම තොරතුර ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය නොහැකි බව පනතෙහි 5(4) වගන්තියෙහි සඳහන් කර ඇත.




පෞද්ගලික තොරතුරු




ජාතික ආරක්ෂාවට හානියක් විය හැකි ආකාරයේ තොරතුරු



ශ්‍රී ලංකාවේ ආර්ථිකයට හානිකර ආකාරයේ තොරතුරු



වෛද්‍ය වාර්තා



වෘත්තීයවේදියෙක් හා මහජන ආයතනයක් අතර සිදුවූ සන්නිවේදනයන්



විශ්වාසය මත ගොඩනැගුණු සම්බන්ධතාවයක් මත පදනම්වූ තොරතුරු (උදා: සේවාලාභියෙකු විසින් ඔහුගේ/ඇයගේ නීතිඥයා වෙත ලබා දෙන තොරතුරු)



අධිකරණයට අගෞරවයක් විය හැකි ආකාරයේ තොරතුරු



පාර්ලිමේන්තුවේ/පළාත්සභාවල වරප්‍රසාද උල්ලංඝනය වන ආකාරයේ තොරතුරු



විභාගයක විශ්වාසනීයත්වයට හානි විය හැකි ආකාරයේ තොරතුරු

තීරණයක් ගෙන නොමැති යම් යම් අමාත්‍ය මණ්ඩල සංදේශ






මැතිවරණ සම්බන්ධයෙන් වන රහස්‍ය තොරතුරු

# ඔබට ආගමික නිදහස සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය යොදා ගත හැක්කේ කෙසේද?



ඔබ දන්නවාද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 14අ ව්‍යවස්ථාව අනුව තොරතුරු දැනගැනීම සඳහා ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ද වේ එම නිසා, ඔබට ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් වුවද ගොනු කළ හැක.



1) ජලය, විදුලි බලය හෝ වෙනත් එවැනි මූලික අයිතිවාසිකමක් සඳහා ඔබට ඇති අයිතිය ඔබ අදහන ආගම පදනම් කර ගෙන ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්:

- ○ එවන් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අදාළ / නීත්‍යානුකූල අධිකාරී ආයතනය එය වන්නේදැයි; සහ
- ○ ඔබට එම සේවාවන් සපයා නොදෙන්නේ කුමන නීතිමය පසුබිමක් පදනම් කර ගෙන දැයි ඔබට අදාළ ආයතනයෙන් ප්‍රශ්න කළ හැක.



2) පාසලට ඔබගේ ළමයා ඇතුළත් කර ගැනීම සඳහා ඔබ සපුරා තිබිය යුතු සියලු නිර්ණායක සම්පූර්ණ කර තිබියදීත් ආගම පදනම් කර ගෙන ඔබගේ දරුවා පාසලට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්; ඒ මන්ද යන්න පිළිබඳව:

- ○ අදාළ පාසලෙන්;
- ○ අදාළ ප්‍රාදේශීය අධ්‍යාපන ආයතනයෙන්; හෝ
- ○ අධ්‍යාපන අමාත්‍යංශයෙන් ඔබට තොරතුරු ඉල්ලා සිටිය හැක.



3) 2008 චක්‍රලේඛය උපුටා දක්වමින් ඔබගේ වන්දනීය ස්ථානය ලියාපදිංචි කරන ලෙස ඔබට බලකරනු ලැබුව හොත්:

- ○ චක්‍රලේඛය බලාත්මක නීතියක් වන්නේ මන්ද යන්න; සහ
- ○ ආගමික ස්ථාන ලියාපදිංචි කළ යුතු යැයි සඳහන් වන්නේ කුමන නීතියකද

යන්න පිළිබඳව ඔබට අදාළ ආයතනයෙන් තොරතුරු ඉල්ලා සිටිය හැක.



4) ඔබ අදාළ සියලුම නීතිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමෙන් පසුව ද:

- ○ වන්දනා කිරීම සඳහා පූජනීය ස්ථානයක් ඉදිකිරීම ඔබට තහනම් කරනු ලැබුව හොත්;
- ○ අදාළ ආයතනය විසින් ඔබගේ සැලසුම් අනුමත කරනු නොලැබුව හොත්;

ඔබට මෙසේ ප්‍රශ්න කළ හැක:

- ○ එවන් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අදාළ/ නීත්‍යානුකූල අධිකාරී ආයතනය එය වන්නේදැයි; සහ
- ○ ඔබගේ සැලසුම් අනුමත නොකිරීමට; හෝ
- ○ ඉදිකිරීම තහනම් කිරීමට පදනම් වූ හේතු මොනවාද යන්න.




5) ඔබගේ පල්ලිය බලහත්කාරයෙන් වසා දමනු ලැබුව හොත්:

- ○ එවන් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අදාළ/ නීත්‍යානුකූල අධිකාරී ආයතනය එය වන්නේදැයි; සහ
- ○ එම තහනම පනවා ඇත්තේ කුමන නීතිමය පසුබිමක් පදනම් කර ගෙන දැයි ඔබට අදාළ ආයතනයෙන් ප්‍රශ්න කළ හැක.



6) නමස්කාර සිදු කිරීම සඳහා ඔබට කිසියම් ප්‍රදේශයකට ඇතුල්වීම තහනම් කරනු ලැබුව හොත්:

- ○ එවන් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අදාළ/ නීත්‍යානුකූල අධිකාරී ආයතනය එය වන්නේදැයි; සහ

- ඔබට කිසියම් ගම්මානයකට/භූගෝලීය ප්‍රදේශයකට (වැඳුම් පිදුම් කිරීම පිණිස) ඇතුල්වීමේ නිදහස ලබා නොදෙන්නේ මන්ද යන්න පිළිබඳව ඔබට අදාළ ආයතනයෙන් තොරතුරු ඉල්ලා සිටිය හැක.




7) ආගම පදනම් කර ගෙන ඔබට පොදු සුසාන භූමියක මෘතදේහයක් භූමදානය කිරීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්:

- එවන් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අදාළ / නීත්‍යානුකූල අධිකාරී ආයතනය එය වන්නේදැයි; සහ
- ඔබට මෘතශරීර භූමදානය කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප කරනු ලබනනේ කුමන නීතිමය පසුබිමක් පදනම් කරගෙනද යන්න පිළිබඳව ඔබට අදාළ ආයතනයෙන් ප්‍රශ්න කළ හැක.

වැඩි දුර තොරතුරු අවශ්‍ය නම් පහත සඳහන් ආයතන සම්බන්ධ කර ගන්නඃ

<u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

කාමර අංක 203 - 204, දෙවැනි පරිශ්‍රය
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07
ඊමේල්ඃ rti.commission16@gmail.com
වෙබ් අඩවියඃ www.rticommission.lk/web/index.php?lang=en
දුරකථන/ෆැක්ස්ඃ 011 269 1625

<u>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය</u>

163 ඇසිදිසි මැදුර
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05
ඊමේල්ඃ info@media.gov.lk
දුරකථනඃ 011 251 3459, 011 251 3460, 011 251 2321, 011 251 3498
වෙබ් අඩවිය www.rti.gov.lk | www.media.gov.lk

<u>ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය</u> (NCEASL)

ඉවැන්ජලිස්ත කිතුණු ප්‍රජාවේ නියෝජිත ආයතනය ලෙස සුළුතර ජනයාගේ ආගමික නිදහස ආරක්ෂා කිරීමට NCEASL ආයතනය කැපවී සිටියි.

ලිපිනයඃ තැ.පෙ. 113, දෙහිවල, ශ්‍රී ලංකාව
දුරකථනයඃ 011 551 1358
ඊමේල්ඃ legal@nceasl.org
වෙබ් අඩවියඃ www.nceasl.org

© The National Christian Evangelical Alliance of Sri Lanka (NCEASL)
All rights reserved.